පාඨක සිත් තුළ මතුවන කුතුහලය ද මෙම කෙටිකතාවේ සාර්ථකත්වයේ ලක්ෂණයකි. තේමාවෙහි පෙනෙන විශේෂත්වයක්, සරල බස කලාත්මක ලෙස යොදා ගැනීමේ හැකියාවත් සමග සිසිරගේ දක්ෂතාව මතු වී පෙනෙනුයේ ප්‍රකට ගී පද රචකයකු, කවියකු, චිත්‍ර ශිල්පියකු නුදුරු අනාගතයේදී හොඳ කෙටිකතා කරුවෙකු ලෙසින්ද පාඨක ලෝකයට පිවිසෙන බවට පෙරනිමිතිද රැගෙනය.

මිනිස් වර්ගයාගේ ප්‍රභවයේ පටන්ම කාන්තාවට කිසියම් අසාධාරණයක් සිදු වෙමින් පවතින බව බොහෝ දෙනාගේ මතයයි. කවර මුහුණුවරකින් හෝ කවර තරමකින් හෝ පුරුෂාධිපත්‍යය සෑම සමාජයකම රජ කරන බව පිළිගැනෙන අතර හැම විටකදීම පාහේ ගැහැනිය අසරණ තත්වයකට ඇද වැටෙන බව අඩු වැඩි වශයෙන් සියලු සමාජවල පිළිගැනීමයි. දිනේෂා දිල්රුක්ෂි විජේසූරිය මෙම කෙටිකතා සංග්‍රහයට එක් කර ඇති (කතා සංග්‍රහය නම් කිරීමට ද යොදා ගෙන ඇති) 'කූඩු කිරිල්ලී' කෙටි කතාව එහි අන්තර්ගතය කියා පාන මාතෘකාවකින් හෙබි නිර්මාණයකි. නිවෙසක කූඩු කර රැක බලාගන්නා කිරිල්ලකට ආහාර පාන ආදර කරුණාව හා වෙනත් සැලකිලි ද කොතෙකුත් ඇති නමුත් නිදහස අහිමිය. අන් පක්ෂීන් මෙන් නිදහසේ පියාසර කර යා නොහැකිය. දිනේෂාගේ කෙටිකතාවෙහි එන සඳමාලි ද එවැනි තත්වයක පසුවන්නියකි.

උගත් කමත් රැකියාවත් පසෙක ලා තම දරුවා රැක බලා ගැනීමට ප්‍රමුඛව නිවසේ සියලුම කටයුතු ඉටු කරමින් අවිවේකීව ගත කරන ජීවිතය විටෙක ඇයට මහත් හිත් වේදනා ගෙන දෙයි. තව දුරත් එමඟින් ඇයගේ සිතේ කනස්සලු බවක් මතු වන්නේ සැමියා තුළ ඒ ගැන කිසිම හැඟීමක් නැති වීමෙනි.

"මොනවද අද ඩිනර්වලට?"

මාලකගේ නොනවතින සුපුරුදු ප්‍රශ්න වැල හමුවේ සඳමාලි මඳ කෝපයක් දැණුනි.

"මන්ද...... තාම හිතුවේ නැහැ"

"බඩගිනියි. ආව ගමන් කන්න බලාගෙන මම මේ ඉන්නේ"

"නිකංවත් මං ගැන ඇහුවද ? මම අද දවසකටම තාම හරියට මොනවත් කාලා නැහැ." ඇයගේ ස්වරයේ රැඳී තිබුණේ නොරිස්සුම් සහගත බවකි.

"හරි හරි ළමයෝ...... අපි ආපුවහම කථා කරමුකෝ...."

මාලක තම බිරිඳ ඇස්වැසීම සඳහා චාටුවෙන් දෙඩීම ආරම්භ කළේය.

(I know I have a fantastic wife)

"ඇති ඇති එන්නකො මම මොනව හරි හදල තියන්නම්"

කතුවරිය මෙහි යොදගත් සංවාද මෙන්ම කතාව ගලා යන සේ ආඛ්‍යාත ස්වරූපයෙන් කියාගෙන යාම ද පාඨක සිත් තුළ විශ්වාසනීයත්වය ඇති කරවන සුලුය. තරුණ අඹු සැමි යුවලක්, මවත් සහ බිළිදෙක්, රැකියාව සඳහා ගොස් දවස පුරා කාර්යාලයේ රැඳී සිට රථවාහන තදබදය මැදින් නිවසට එමින් සිටින සැමියෙක් යන මේ සියලු චරිත මධ්‍යයේ බිරිඳ පත් වී සිටින තත්වය, ඇය තුළ ඇති කනස්සල්ල, සැමියා ඒ දෙස බලන ආකාරය යනාදියත් පවුල් ජීවිතයක් තුළ පුද්ගලයන්ට,




විශේෂයෙන්ම කාන්තාවන්ට මුහුණ දීමට සිදු වන දුෂ්කරතාව මැනවින් නිරූප ණය කරන මෙම කෙටි කතාව පැහ

ැදිලි සමාජ විවරණයකි. කෙසේ නමුදු සාහිත්‍ය කරුවකු තම නිර්මාණය අවසා නයේ දී තීරණ වලට එළඹී හෝ පාඨක යාට හරි වැරදි කියාදීම හෝ නොකළ යුතු බව මෙහි කතුවරිය හොඳින් දන්නා බවට මෙම කෙටිකතාව දෙස් දෙයි.

"කූඩු කිරිල්ලී" කෙටි කතා සංග්‍රහය මගින්
ආධුනික ලේඛක ලේඛිකාවන් කිහිප දෙනෙකුම දොරට වඩවාලීම ස්වර්ණකාන්ති අතින් සිදු වී ඇත්තා සේම ජගත් ජේ. එදිරිසිංහ වැනි ප්‍රවීණ ලේඛකයන්ගේ නිර්මාණවලට ද මෙම කතා එකතුව තුළ අවස්ථාවක් ලබා දී ඇත.

'ගන්ධබ්බ' ජගත් ජේ එදිරිසිංහගේ කෙටිකතාවක් ලෙස මෙම කෘතියට එක් කර ඇති තුන්වන කෙටිකතාවයි. කතාවේ ආරම්භයට කතුවරයාගේ නිර්මාණ කුසලතාව පෙන්වන බව කිව හැකිය. "ජනේලයෙන් පිටත කෑ ගසමින් උන් බට්ටිච්චාගේ හඬ දැන් ඇසෙන්නේ නැත. එය අසාමාන්‍ය නොවේ. කොහොමටත් සෑම දිනකම මේ වේලාව වන විට කුරුල්ලන්ගේ හඬ නැ වතෙයි. තව පැය කාලක් යන්නට පෙර සමුද්‍රා මට පානයක් රැගෙන මේ කාමරයට එනු ඇත........." අවශ්‍ය පරිදි සංකේත යොදා ගනිමින් කතා වට මුල පුරන කතුවරයා කෙ මෙන් කෙමෙන් කතාව දිග හැරලන්නේ එහි මූලික තේමාව පිළිබඳව පාඨකයාට දැනෙන්නට සලස්වමිනි.

රෝගීව, දුබලව සිටින සිය සැමියා (ආනන්ද) වෙත සමුද්‍රා දක්වන ආදරයත්, තවමත් තරුණ වියේ පසු වන සමුද්‍රා කෙරෙහි සුදරක තුළ ඇති ඇල්මත් මෙම තුන් කොන් බැඳීම මිනිස් ජීවිතය හා බද්ධ වී ඇති ආකාරයත් කතාව පුරාම විහිදී පැතිරී යන අරුතයි. එක්තරා දුරකට යථාර්ථයෙන් බැහැර වෙමින් චරිතවල විශේෂයෙන්ම සැමියාගේ චරිතය 'ගන්ධබ්බ' පාදක කර ගෙන විකාශනය වන මෙම කතාව පාඨකයාට පහසුවෙන් ග්‍රහණය කරගත හැකි වන සේත් යම් තරමක විශේෂ කතා ශෛලියකට බර වන සේත් රචනා කර ඇති ආකාරය අපූරුව දක්ෂ කෙටිකතා හා නවකතා කරුවකු ලෙස ජගත් මෙම කතාව තුළින් ද රසවත් සාර්ථක කෙටිකතාවක් ඉදිරිපත් කරන්නේ කෙටිකතා කලාවේ අලුත්ම ඉසව්වකට පාඨකයා ගෙන යමිනි. භාෂා භාවිතය අතින් මෙහි පෙනෙන සාර්ථක බවද සමස්ත නිර්මාණයෙහි සාර්ථකත් වයට හේතු වී ඇත.

ශ්‍රිනාත් මද්දුමගේ සිය කුළුදුල් කෙටිකතාව ලෙසින් මෙම කතා එක් කර ඇති "සදුර්ග මගියෝ" සැබවින් කෙටිකතා රචනයෙහි ආධුනිකයකුගේ කෘතියක් බවට ඉගියකුදු නොදේ යයි මට සිතේ මෙම කෘතියෙහි අන්තර්ගත අතර ශ්‍රිනාත්ගේ නිර්මාණය ද විශේෂිත වූ ශෛලීන් අනුගමනය කර ලියා ඇති අතර ශ්‍රිනාත්ගේ නිර්මාණය ද විශේෂිත වූ ශෛලීන් රචනා වූවකි. ඔහු පවසන පරිදි හා හා පුරා කියා මෙලෙස කෙටිකතා ලියවූ එමගින් කතුවරයාගේ බුර බුරා නැගෙන නිර්මාණයකට මග පාද ඇත. නළුවකු ලෙස තම කලා ජීවිතය ඉදිරියට ගෙන ආ පැහැබර අතීතයකට හිමිකම් කියා ශ්‍රීනාත් මද්දුමගේ 'සදුර්ග මගියෝ' කෙටිකතාව රචනයෙන් තම නිර්මාණ ජීවිතය තවත් දෙසකට යොමු කරගෙන ඇත. සංවේදී පුවතක් අන්තර්ගත මෙම කතාවෙහි පාඨකයාට ආශාවෙන් කියවිය හැකි ලක්ෂණ බොහෝ වෙයි.

'කූඩු කිරිල්ලී' කියවන ශ්‍රී ලාංකික පාඨකයන් ශ්‍රී ලංකාවේ ජීවත් වූවත් ඔස්ට්‍රේලියාව හෝ අන් කවර රටක ජීවත් වූවත් සිය නිජ බිම තුළ විටින් විට සිදු වූ විවිධාකාර විපත් ගැන සංවේගයෙන් යුතුව සිහිපත් කරන බව සැබැවකි. මෙම කෙටිකතා සංග්‍රාමයෙහි ඇතුළත් පළමුව එන නිර්මාණය වන 'කඳු පාමුල සරෝජනී' ලක්ෂ්මන් කොඩිතුවක්කු ලේඛකයා උක්ත කරුණ සනාථ කරමින් සිය නිර්මාණය කර ඇති බවට කදිම සාක්ෂිකි.

සමස්තයක් ලෙස ගත් විට තම නිජබිමෙන් ඈත්ව දිවි ගෙවම් වුවද සිංහල දේශයටත් සිංහල සාහිත්‍යයටත් ඇල්මක් දක්වන හැමට........

1000 Business Cards + Design $150+gst
⊘420gsm Artboard ⊘Full Color Double Side Print ⊘Matt Lamination ⊘FREE Delivery Australia Wide
Say Hello : 0466 597 991
info@crystald.com.au | www.crystald.com.au
Offer Ends 31st August 2018